# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**6 ශ්‍රේණිය**

## සිංහල භාෂාව හා සාහිත්‍යය

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

### I කොටස

**සැලකිය යුතුයි**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.

---

✶ **ඉරි ඇඳි පදයට වඩාත් ගැළපෙන අර්ථය සහිත යෙදුම තෝරන්න.**

01) සමහර බස් රථ **ඉබි ගමනින්** යන්නේ යැයි මඟීහු චෝදනා කරති.
1) ඉබ්බෙකු මෙන්
2) ඉතා වේගයෙන්
3) ඉතා සෙමින්
4) තැන තැන නවත්වමින්

02) කසුන් හා විශ්ව **අඹ යහළුවන්** බව මාමා පැවසී ය.
1) නරක මිතුරන්
2) හොඳම යහළුවන්
3) කපටි යහළුවන්
4) අඹ කෑමට ප්‍රිය මිතුරන්

03) අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
1) දිලිඳු - බයානක
2) ලේඛනය - පුස්තකාලය
3) උච්ඡාරනය - විෂිශ්ඨ
4) පරිඝණකය - කනිශ්ඨ

04) "අහස" යන පදයට සමාන පදයක් වන්නේ
1) අඹර
2) පොළව
3) දෙරණ
4) භූමිය

05) "ආරෝහණ" යන පදයට විරුද්ධ පදය වන්නේ
1) රෝහණ
2) දුර්වර්ණ
3) නිර්රෝහණ
4) අවරෝහණ

06) "කුරිරු" යන වචනයෙහි ඇති පිල්ලම් අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.
1) කෙටි ඇදය, කෙටි ඉස්පිල්ල, කෙටි ඇදය
2) කෙටි ඇදය, ඇලපිල්ල, කෙටි පාපිල්ල
3) කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල
4) කෙටි ඇදය, ඇලපිල්ල, කෙටි පාපිල්ල

07) උත්තම පුරුෂ බහු වචන පදය වන්නේ
1) නුඹලා
2) අපි
3) මම
4) තොපි

08) ප්‍රථම පුරුෂ පදයක් නොවන්නේ මින් කුමක් ද?
1) ගස
2) අයියා
3) නුඹ
4) පැන්සල

09) ස්වර අක්ෂර හඳුන්වනු ලබන නමක් වන්නේ මින් කුමක් ද?
1) ගතකුරු
2) හසකුරු
3) පණකුරු
4) ගාත්‍රාක්ෂර

✶ **සුදුසු ආඛ්‍යාත පදය තෝරන්න.**

10) ගුරුවරු දරුවන්ට අකුරු ……………………….
   1) උගන්වයි   2) උගන්වති   3) ඉගැන්වූවාය   4) ඉගැන්නුවේය

11) ගස් සුළඟට ……………………..
   1) සෙලවෙති   2) සෙලවුණෝ ය   3) සෙලවෙයි   4) සෙලවූහ

12) උපාසිකාව සිල් ………………………
   1) ගත්තේ ය   2) ගත්තෝ ය   3) ගනිති   4) ගත්තා ය

13) හල් කළ හැකි ව්‍යඤ්ජන අක්ෂරය වන්නේ කුමක්ද?
   1) ග   2) ඩ
   3) ජ   4) ඹ

14) පහත වාක්‍යය අතුරින් නාම විශේෂණ පදයක් සහිත වාක්‍යය තෝරන්න.
   1) මල්ලී බයිසිකලය පදියි.   2) අම්මා උදෑසන ම වැඩට ගියා ය.
   3) දිග හූවක් ඇසෙන්නට විය.   4) අක්කා බුදුන්ට මල් පූජා කළා ය.

15) "ඇවිදින කොළයා" පාඩමෙහි කතුවරයා වන්නේ
   1) කුමාරතුංග මුනිදාස මහතා   2) මාර්ටින් වික්‍රමසිංහ මහතා
   3) ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමා   4) ඒ.පී. ගුණරත්න මහතා

✶ **පහත වාක්‍යයේ ඇතුළත් විරාම ලකුණු නිවැරදි ව නම් කර ඇති පිළිතුර තෝරන්න.**

16) අහෝ, ඒ සතාගේ දිග මහත !
   1) තනි උඩු කොමා, විස්මයාදී ලකුණ   2) කොමාව, ප්‍රශ්නාර්ථ ලකුණ
   3) පෙරළි කොමා, විස්මයාදී ලකුණ   4) කොමාව, විස්මයාදී ලකුණ

✶ **අංක 17 හා 18 ප්‍රශ්නවල අනුක්ත නාම පදයක් යෙදී ඇති පිළිතුර තෝරන්න.**

17)
   1) බල්ලෝ   2) ගුරුවරු   3) වෙළෙන්දන්   4) මිනිස්සු

18)
   1) කාන්තාවක්   2) මීයෝ   3) ගායිකාවක   4) දෙමව්පියෝ

✶ **පහත 19 හා 20 ප්‍රශ්නවල නිවැරදි ලෙස ස්වර ව්‍යඤ්ජන වෙන් කර ඇති පද පේළිය තෝරන්න.**

19)
   1) උලමා → අ + උ + ල + අ + මා   2) පාසල → පා + ස් + අ + ල් + අ
   3) ඒකල → ඒ + ක් + අ + ල් + අ   4) පනුවා → ප් + අ + න් + උ + ව + අ

20)
   1) බල්ලා → බ්+ අ + ල් + ල් + ආ   2) මස්ස → ම් + අ + ස් + අ + ස් + අ
   3) හපන් → හ් + අ + ප + න් + අ   4) ඉස්සා → ඉ + ස් + අ + සා

(ලකුණු - $2 \times 20 = 40$)

## II කොටස

**උපදෙස්**

- **මෙම කොටසේ 01 සහ 02 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.**
- **ප්‍රශ්න අංක 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් ප්‍රශ්න 03ක් තෝරා ගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

---

01) ජන කවි පිළිබඳව ඔබ සකස් කර ගත් පොත් පිංච ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඔබ සකස් කරන ලද පොත් පිංචට යෙදූ නම කුමක්ද? (ල 2)

ii. පොත් පිංච සකස් කරගැනීම සඳහා තොරතුරු සොයා ගත් මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ල 2)

iii. පොත් පිංචට ඔබ යෙදූ කවි වර්ග දෙකක් ලියන්න. (ල 4)

iv. පොත් පිංච නිර්මාණයේ දී ඔබ මුහුණපෑ ගැටලු දෙකක් ලියන්න. (ල 4)

v. පොත් පිංච සකස් කිරීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල 4)

(මුළු ලකුණු 16)

02) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 125කට නොඅඩු රචනයක් ලියන්න.

i. පියකරු උදෑසනක්

ii. ප්‍රිය වචන කතා කරමු

iii. රස ගුණ පිරි දේශීය ආහාරයට හුරු වෙමු

iv. පරිසරය සුරකිමු

(ලකුණු 14)

03) ඔබ සුන්දර ගමක වෙසෙන්නේ යැයි සිතන්න. මෙවර පාසල් නිවාඩුවට නගරයේ සිටින මිතුරෙකුට හෝ මිතුරියකට ඔබේ නිවසට පැමිණෙන ලෙස ඉල්ලමින් ඔබේ ගමේ සුන්දරත්වය ගැන ද විස්තර කරමින් යවන ලිපිය ලියන්න.

(ලකුණු 10)

04) පහත සඳහන් උද්ධෘත පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) **"කිමෙක් ද? දරුවෙනි, පැන් නො බොව් දූ"**

i. මෙසේ ප්‍රකාශ කළේ කවුරුන්ද? (ල 1)

ii. මෙසේ කීවේ කා හටද? (ල 1)

iii. ඉහත ප්‍රකාශය උපුටා ගත් පාඩමේ නම කුමක්ද? (ල 1)

iv. එම කතාව ඇතුළත් මුල් කෘතිය කුමක්ද? (ල 1)

v. ඉහත ප්‍රකාශය ඇතුළත් මුල් කෘතියේ ඇති කතා ගණන කොපමණ ද? (ල 1)

(ආ) **"මාත් ඉතින් මෙච්චර කාලයක් මේ විලේ එකට හිටිය කෙනෙක් නේ "**

i. මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් ද? (ල 1)

ii. මෙසේ ප්‍රකාශ කළේ කා හට ද? (ල 1)

iii. මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද? (ල 1)

iv. එම කතාව උපුටා ගත් මුල් කෘතිය කුමක්ද? (ල 1)

v. එම කෘතියෙහි කතුවරයා කවුද? (ල 1)

(ලකුණු 10)

05) (අ) පහත සඳහන් පද්‍යවල හිස්තැන් සම්පූර්ණ කරන්න.

i. ...........................................

...........................................

පඹයෙකුගෙ විලසින

ඉඳුම හොඳ නෑ බූත කරමින

(ල 2)

ii.

බතල කනන බැරි බතලේ ගල කන්ද
අලට කන්ට බැරි අලගල්ලේ කන්ද
………………………………………………………….
………………………………………………………….

(ල 2)

(ආ) පෙළපොතේ ඇතුළත් පාඩම් ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. "අලි උවදුර" කුමන කෘතියෙන් උපුටා ගත්තක් ද?
ii. "සිරිත් මල්දම" කෘතියේ කතුවරයා කවුද?
iii. "රණපාල" කෘතියේ කතුවරයා කවුද?

(ල 3)

(ඇ) පහත වචනවල ස්වර ව්‍යඤ්ජන වෙන් කරන්න.

i. ඔටුන්න ii. රිලවා iii. ඕලු

(ල 3)

(මුළු ලකුණු 10)

06) පහත සඳහන් වැකිවලට සුදුසු අතීත කාල ආඛ්‍යාත පද ලියන්න.

i. අයියා බයිසිකලය …………………………..
ii. මම සෙල්ලම් …………………………..
iii. කම්කරුවෝ වැඩ …………………………..
iv. කුරුල්ලා අහසේ …………………………..
v. ගුරුතුමිය පාඩම …………………………..
vi. නුඹ පාසල් …………………………..
vii. අපි සෙල්ලම් …………………………..
viii. අම්මා බත් …………………………..
ix. තාත්තා වැඩට …………………………..
x. ගස සුළඟට …………………………..

(ලකුණු 10)

07) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමි සිකීම් දේශයේ උපන් මෙරට ජාතික වීරයන් ගැන කියවෙන අවස්ථාවලදී නොවැරදීම කියැවෙන සුවිශේෂී නාමයකි. 1901 ජන්මලාභය ලැබූ මේ හිමිගේ ගිහි නම වූයේ තෂි නම්ගයාල් ය. අවුරුදු දෙළහේ දී ලංකාවට පැමිණි කුඩා තෂි කොළඹ විද්‍යෝදය පිරිවෙනින් ද මරදානේ මහාබෝධි විද්‍යාලයෙන් ද අධ්‍යාපනය ලැබීය. උන්වහන්සේ වඩාත් ප්‍රකට වූයේ කවියෙකු හා දේශකයෙකු ලෙසට ය. මව්බිමේ උපත ලැබූවෙකුටත් වඩා දැහිතකාමී හැඟීමෙන් යුතුව වැඩිහිටියන් මෙන්ම දරුවන් තුළ ද ජාතිකාභිමානී හැඟීම් පුබුදුවාලන්නට උන්වහන්සේ කවි ලියූහ. ඇස්. මහින්ද හිමි ලියූ කාව්‍ය ග්‍රන්ථ අතර කව්මුතු, කව්මිණ, ළමා කවි කළඹ ප්‍රධාන තැනක් ගනී.

i. ඇස්. මහින්ද හිමියන්ගේ ගිහි කළ නම කුමක් ද?
ii. උන්වහන්සේ මෙරටට පැමිණියේ වයස අවුරුදු කීයේ දී ද?
iii. ඇස්. මහින්ද හිමි උපන් රට කුමක් ද?
iv. උන්වහන්සේ වඩාත් ප්‍රසිද්ධ වූයේ කවුරුන් ලෙස ද?
v. උන්වහන්සේ ළමයින් සඳහා ලියූ කාව්‍ය නිර්මාණ දෙකක් නම් කරන්න.

(ලකුණු - $2 \times 5 = 10$)